# 6 ශ්‍රේණිය

## පුරවැසි අධ්‍යාපනය

**2 ඒකකය**

## <u>අප ජීවත්වන ප්‍රදේශය</u>

<u>ශ්‍රී ලංකාවේ පරිපාලන ඒකක</u>

1. පළාත
2. දිස්ත්‍රික්කය
3. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය
4. ග්‍රාම නිළධාරී කොට්ඨාසය

<u>ග්‍රාම නිළධාරී කොට්ඨාසය</u>

- ශ්‍රී ලංකාවේ පරිපාලන බෙදීම් අනුව කුඩාම පරිපාලන ඒකකය වේ.
- කුඩාම පරිපාලන ඒකකය බාර නිළධාරියා ග්‍රාම නිළධාරී ලෙස හැඳින්වේ.
- රජය හා සම්බන්ධ සියලු කටයුතු වලදී ගම්වැසියන් හා ගමේ තොරතුරු සම්බන්ධීකරණය කිරීම ප්‍රධානතම කාර්යය වේ.

<u>ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය</u>

- ග්‍රාම නිළධාරී කොට්ඨාස සමූහයක් එකතුවී සෑදෙයි.
- මෙම පරිපාලන ඒකකය භාර ප්‍රධානියා ප්‍රාදේශීය ලේකම් වේ.
- තම බල ප්‍රදේශයේ සියලු ග්‍රාම නිළධාරී කොට්ඨාසවල රජය හා සම්බන්ධ සියලු රාජකාරි කටයුතු වලට වග නියන බලධාරියා ය.

<u>ඇගයීම ( පෙළ පොත උදව්කර ගන්න)</u>

1. ශ්‍රී ලංකාවේ පරිපාලන ඒකක අතරින් කුඩාම පරිපාලන ඒකකය ලියා දක්වන්න
2. ඉහත කුඩාම පරිපාලන ඒකකය භාර නිළධාරියා හඳුන්වන නම ලියන්න.
3. එම නිළධාරියාගේ ප්‍රධානතම කාර්යය ලියා දක්වන්න.
4. ඔබ නිවස අයත් ග්‍රාම නිළධාරී කොට්ඨාසයේ නම සහ අංකය ලියන්න.
5. ඔබ පාසල අයත් ග්‍රාම නිළධාරී කොට්ඨාසයේ නම සහ අංකය ලියන්න.
6. ග්‍රාම නිළධාරී කොට්ඨාස සමූහයක් එක් වී ගොඩනැගෙන පරිපාලන ඒකකය හඳුන්වන නම ලියන්න.
7. ඉහත (6) ඒකකයේ ප්‍රධානියා නම් කරන්න.
8. එම ප්‍රධානියාගේ කාර්යය ලියන්න.
9. ඔබේ පාසල හා නිවස අයත් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය හා අංකය ලියන්න.